සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023 (2024)

ඉන්දීය ඉතිහාසය II (I කොටස)
இந்திய வரலாறு II (பகுதி I)
History of India II (Part I)

25 A | S | II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

ඉන්දීය ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා

විභාග අංකය ..............................

උපදෙස්:
* මෙම ප්‍රශ්න පත්‍රය I හා II ලෙස කොටස් **දෙකකින්** සමන්විත වේ.
* **I කොටසෙහි 1- 40** දක්වා ප්‍රශ්න **සියල්ලට ම මෙම පත්‍රයේ ම ලබා දී ඇති උපදෙස් පරිදි** පිළිතුරු සපයන්න.
* **I කොටසෙහි** නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු **එක** බැගින් හිමි වේ.
* කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි**. පිළිතුරු ලියා අවසන් වූ පසු **I කොටස**, **II කොටසේ** පිළිතුරු පත්‍ර සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

- අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නොගැළපේ.** එම **නොගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

1. (1) සුප්පාරක (2) තාම්‍රලිප්ති (3) සාංචි
(4) භාරුකච්ඡ (5) කාවේරි පට්ටන (......)

2. (1) ක්‍රිෂ්ණ (2) තප්ති (3) තුංගභද්‍රා
(4) ගෝධාවරී (5) මහානදී (......)

3. (1) කාංචිපුරම් (2) තංජෝර් (3) මදුරෙයි
(4) තානේෂ්වර් (5) විජයනගර් (......)

4. (1) තෝසලි (2) සුවර්ණගිරි (3) උජ්ජේනි
(4) තක්ෂිලා (5) කාම්බෝජ (......)

5. (1) අංග (2) මගධ (3) කාශි
(4) වජ්ජි (5) කෝසල (......)

6. (1) සාමන්ත (2) සාම්රාට් (3) විරාට්
(4) රාජාධිරාජ් (5) අධිරාජ් (......)

7. (1) මේඝදූත (2) මෘච්ඡකටිකා (3) ඍතුසංහාර
(4) රඝුවංශ (5) කුමාරසම්භව (......)

8. (1) වත්සරාජ් (2) යශෝධර්මන් (3) ධ්‍රැව
(4) නාගභට (5) ධර්මපාල (......)

[දෙවැනි පිටුව බලන්න.

9. (1) ලිඩියා (2) ඇරකෝසියා (3) එරිත්‍රියා
(4) හොරාස්මියාදේශ (5) ගෙඩ්‍රෝසියා (......)

10. (1) පල්ලව (2) චෝළ (3) පාල
(4) පාණ්ඩ්‍ය (5) චේර (......)

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එක යුගලයක** පද එකිනෙකට **නොගැළපේ**. එම **නොගැළපෙන** යුගලය නිවැරදිව හඳුනාගෙන, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

11. (1) ඛාරවේල - හාතිගුම්ඵා
(2) රුද්‍රදාමන් - ජුනාගාර්ඩ්
(3) හර්ෂවර්ධන - මන්සේහ්රා
(4) පළමුවන පුලකේෂින් - අයිහොලේ
(5) පළමුවන රාජේන්ද්‍ර - ත්‍රිවෙන්ද්‍රම් (......)

12. (1) අංග - චම්පා
(2) කාශි - බාරාණසි
(3) ලිච්ඡවි - වෛශාලි
(4) කුරු - පංචාල
(5) වත්ස - කෞශාම්බි (......)

13. (1) කපිලවස්තු - ශාක්‍ය
(2) මිථිලා - විදේහ
(3) රාමගාම - මල්ල
(4) පිප්ඵලිවන - මෞර්ය
(5) අල්ලකප්ප - බුලිය (......)

14. (1) බිම්බිසාර - හර්යංක
(2) උදායින් - සිසුනාග
(3) ධනනන්ද - නන්ද
(4) කුණාල - මෞර්ය
(5) පුෂ්‍යමිත්‍ර - ශුංග (......)

15. (1) භාරවි - කිරාතාර්ජුනීය
(2) විශාඛදත්ත - මුද්‍රාරාක්ෂස
(3) වරාහමිහිර - බෘහත්සංහිතා
(4) කාලිදාස - රත්නාවලී
(5) ආර්යභට - සූර්ය සිද්ධාන්ත (......)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරවල දී ඇත. **Y** තීරයේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නො වේ**. **Y** තීරය **X** තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

| | X | | Y |
|---|---|---|---|
| 16. | (i) දණ්ඩින් | A | මත්තවිලාස ප්‍රහසන |
| | (ii) මහේන්ද්‍රවර්මන් | B | කථාසරිත්සාගර |
| | (iii) සෝමදේව | C | දශකුමාරචරිත |
| | (iv) කල්හණ | D | නාගානන්ද |
| | (v) හර්ෂවර්ධන | E | රාජතරංගිණී |

(1) ACDBE (2) BDCAE (3) CABED (4) CBAED (5) DCEBA (......)

| | X | | Y |
|---|---|---|---|
| **17.** | (i) බින්දුසාර | A | කවිරාජ් |
| | (ii) අශෝක | B | දක්ෂිණාපථනාථ |
| | (iii) සමුද්‍රගුප්ත | C | දේවානම්පිය |
| | (iv) දන්තිදුර්ග | D | අමිත්‍රඝාත |
| | (v) පළමුවන සාතකර්ණි | E | පරමභට්ටාරක |

(1) BCAED (2) CADEB (3) CBADE (4) DBACE (5) DCAEB (......)

| | X | | Y |
|---|---|---|---|
| **18.** | (i) ඉන්ද්‍රප්‍රස්ථ | A | යමුනා |
| | (ii) භාරුකච්ඡ | B | ගංගා |
| | (iii) රූපාර් | C | සට්ලෙජ් |
| | (iv) කනෞජ් | D | නර්මදා |
| | (v) හරප්පා | E | රාවි |

(1) ACBDE (2) ADCBE (3) BDACE (4) CBAED (5) DACBE (......)

| | X | | Y |
|---|---|---|---|
| **19.** | (i) මදුරෙයි | A | පළමුවන පුලකේෂින් |
| | (ii) වාතාපි | B | ශ්‍රී මාර ශ්‍රී වල්ලභ |
| | (iii) පුරුෂපුර | C | සමුද්‍රගුප්ත |
| | (iv) පාටලීපුත්‍ර | D | කනිෂ්ක |
| | (v) තංජෝර් | E | පළමුවන රාජරාජ |

(1) ABEDC (2) ADEBC (3) BACED (4) BADCE (5) CADEB (......)

| | X | | Y |
|---|---|---|---|
| **20.** | (i) මහාකාන්තාර | A | උග්‍රසේන |
| | (ii) කොට්ටූර | B | දමන |
| | (iii) එරන්දපල්ල | C | ස්වාමිදත්ත |
| | (iv) පාලක්ක | D | හස්තිවර්මන් |
| | (v) වෙංගී | E | ව්‍යාඝ්‍රරාජ් |

(1) ECBAD (2) ECDAB (3) EDABC (4) EDCAB (5) EDCBA (......)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නො ගැළපේ**. එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21. බිම්බිසාර රජු**

(1) බුද්ධ කාලයෙහි දී මගධය පාලනය කළේ බිම්බිසාර රජු ය.
(2) බිම්බිසාර රජු පර්සියාව සමග සමීප සම්බන්ධතා පවත්වා ඇත.
(3) බිම්බිසාර පාලන සමයේ දී මගධයේ අගනුවර වූයේ රාජගෘහයයි.
(4) බ්‍රහ්මදත්ත රජු පරාජය කිරීමෙන් පසු බිම්බිසාර අංග ජනපදය සිය රාජධානියට ඈඳා ගත්තේ ය.
(5) බිම්බිසාරගේ ප්‍රධාන බිසෝවරු වූයේ කෝසලදේවි, චෙල්ලනා සහ ඛේමා ය. (......)

**22. ශකවරු**

(1) ශකවරු මධ්‍ය ආසියාවේ සිට සංක්‍රමණය වූ සංචාරක ගෝත්‍රයකි.
(2) ශකවරු යටතේ පැවති ප්‍රදේශ ක්ෂත්‍රප වශයෙන් බෙදා තිබිණි.
(3) තක්ෂිලාහි මුල්ම ශක පාලකයා මාවුස් ය.
(4) රුද්‍රදාමන් උජ්ජේනියේ මහාක්ෂත්‍රප විය.
(5) ශකවරු පරාජය කරමින් බලයට පැමිණියේ කුජුල කැඩ්පයිසීස් ය. (......)

**23. ශුංගයෝ**

(1) බෘහද්‍රථ රජු මරාදමා පුෂ්‍යමිත්‍ර කිරුළ පැහැර ගත්තේ ය.
(2) ශුංගයෝ බ්‍රාහ්මණ වංශිකයෝ වූහ.
(3) මහා වෛයාකරණයෙකු වූ පතංජලී පුෂ්‍යමිත්‍රගේ සමකාලීනයකු විය.
(4) භාරුත් ස්තූපයේ ගරාදිවැට ඉදිකළේ ශුංග පාලන සමයේ දී ය.
(5) ඉන්දු-ග්‍රීකයෝ අවසන් ශුංග රජු පරාජය කොට එම රාජධානිය යටත්කර ගත්තේ ය. (……)

**24. මිනැන්ඩර්**

(1) ඇලෙක්සැන්ඩර්ට වඩා වැඩි ජාතීන් සංඛ්‍යාවක් මිනැන්ඩර් විසින් දිනා ගත් බව ස්ට්‍රාබෝ ප්‍රකාශ කර ඇත.
(2) මිනැන්ඩර් බෞද්ධයෙකි.
(3) මිනැන්ඩර්ගේ රාජධානියේ අගනුවර සාකල විය.
(4) මිනැන්ඩර් නිකුත් කළ ඇතැම් කාසිවල බුද්ධරූප දක්නට ඇත.
(5) මිලින්දපඤ්හයෙහි අන්තර්ගත වන්නේ මිනැන්ඩර් රජු විසින් නාගසේන හිමියන්ගෙන් බුදු දහම පිළිබඳ ඇසූ ප්‍රශ්න කිහිපයකි. (……)

**25. නන්දයෝ**

(1) සිසුනාග රාජ වංශය බලයෙන් පහ කරන ලද්දේ නන්ද රාජ වංශයේ ආරම්භකයා වූ මහාපද්ම නන්ද විසිනි.
(2) මහාපද්ම නන්ද මහා ඇලෙක්සැන්ඩර්ගේ සමකාලීනයෙකි.
(3) මහාපද්ම නන්දගෙන් පසු ඔහුගේ පුතුන් අටදෙනා බලයට පත්වූහ.
(4) නන්දයන්ගේ යුද බලය නිසා මහා ඇලෙක්සැන්ඩර් ඔහුගේ යුද ප්‍රයාන බියස් නදියෙන් ඉදිරියට ගෙන ගියේ නැත.
(5) චාණක්‍යගේ ආධාර ඇතිව චන්ද්‍රගුප්ත මෞර්ය විසින් අන්තිම නන්ද රජු පළවා හරින ලදි. (……)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A)**, **(B)**, **(C)** හා **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක්** හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ............................................ **1** ද
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ............................................ **2** ද
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ............................................ **3** ද
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ............................................ **4** ද
**වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් .............. **5** ද **වරහන තුළ** ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය. |

**26. තක්ෂිලා**

(A) තක්ෂිලාව ගාන්ධාරයේ අගනුවරයි.
(B) තක්ෂිලාව සුප්‍රසිද්ධ අධ්‍යාපන මධ්‍යස්ථානයකි.
(C) තක්ෂිලා පාලක ආම්භි රජු විසින් මහා ඇලෙක්සැන්ඩර් පිළිගෙන ඔහුට තම භේවායන්ගේ සේවය ලබා දෙන ලදි.
(D) තක්ෂිලාහි උපරාජ වූ අසෝක උජ්ජෙනි වෙත යවන ලද්දේ සුසීමගේ කැරලි මර්දනය කිරීම සඳහා ය. (……)

**27. පාහියන් හිමි**

(A) පාහියන් හිමි ඉන්දියාවට ඇතුළු වූයේ ටිබෙටය හරහා ය.
(B) පාහියන් හිමි ඉන්දියාවට පැමිණියේ බෞද්ධ ග්‍රන්ථ ලබා ගැනීමේ සහ බෞද්ධ සිද්ධස්ථාන වැඳ පුදා ගැනීමේ පරමාර්ථයෙනි.
(C) චීනයට යාමට පෙර පාහියන් හිමි ශ්‍රී ලංකාවට පැමිණියේ ය.
(D) පාහියන් හිමි කනෞජ සම්මේලන පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් සපයා ඇත. (……)

[පස්වැනි පිටුව බලන්න

**28. ස්කන්ධගුප්ත**

(A) හූණ ආක්‍රමණ පලවා හැරීමට ස්කන්ධගුප්ත සමත් විය.
(B) ස්කන්ධගුප්ත රජ සමයේ දී ගිර්නාර්හි ජලාශයක බැම්ම ප්‍රතිසංස්කරණය කරන ලදී.
(C) ස්කන්ධගුප්ත රජු විසින් සුප්‍රසිද්ධ බෞද්ධ අධ්‍යාපන ආයතනයක් නාලන්දාහි පිහිටුවන ලදී.
(D) ගුප්තයින් හා වාකාටකයින් අතර විවාහ සම්බන්ධතාවයක් ස්කන්ධගුප්ත රජ සමයේ දී සිදුවිය. (......)

**29. බටහිර චාලුක්‍යයෝ**

(A) බටහිර චාලුක්‍යයින්ගේ අගනුවර වාතාපි විය.
(B) බටහිර චාලුක්‍ය රාජවංශයේ ආරම්භකයා පළමුවන පුලකේෂින් ය.
(C) හර්ෂවර්ධන දකුණු දෙසට කළ ආක්‍රමණය ව්‍යර්ථ කිරීමට දෙවන පුලකේෂින්ට හැකි විය.
(D) දෙවන පුලකේෂින්ගේ සමයේ දී පාහියන් බටහිර චාලුක්‍ය රාජධානියට පැමිණියේ ය. (......)

**30. පාණ්ඩ්‍යයෝ**

(A) පාණ්ඩ්‍යයන් තම අධිරාජ්‍යයේ දකුණු සීමාවේ සිටි නිදහස් ජාතියක් ලෙස අශෝක රජුගේ ගිරිලිපි කිහිපයක දැක්වේ.
(B) පළමුවන පාණ්ඩ්‍ය අධිරාජ්‍යයේ ආරම්භකයා කඩුන්ගෝන් ය.
(C) පළමුවන පරාන්තක විසින් ශ්‍රී මාර ශ්‍රී වල්ලභගේ රාජ්‍යය අල්ලා ගන්නා ලද නිසා ඔහු ලංකාවට පැන ගියේ ය.
(D) මාරවර්මන් රාජසිංහ විසින් ශ්‍රී ලංකාව ආක්‍රමණය කරන ලදී. (......)

- අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31.** බරෝෂ්ඨි අක්ෂරයෙන් ලියා ඇති අශෝක අධිරජුගේ සෙල්ලිපිය කුමක් ද?
(1) ගිර්නාර් ගිරිලිපිය (2) ධෞලි ලිපිය (3) බරාබර් ගුහා ලිපිය
(4) දිල්ලි-තෝප්‍රා ටැම් ලිපිය (5) ෂාබාශ්ගරි ගිරි ලිපිය (......)

**32.** 'ඉන්ඩිකා' ග්‍රන්ථයේ කර්තෘවරයා කවරෙක් ද?
(1) ඒරියන් (2) මෙගස්තිනිස් (3) ජස්ටින්
(4) ස්ට්‍රාබෝ (5) ටොලමි (......)

**33.** සාතවාහන රාජ වංශයේ ආරම්භකයා ලෙස සැලකෙන්නේ කවරෙක් ද?
(1) වාසුදේව (2) සිමුක (3) කෘෂ්ණ
(4) සුසර්මන් (5) පළමුවන සාතකර්ණි (......)

**34.** ගුප්ත රජ කුමරියක් වූ ප්‍රභාවතී ගුප්තා විවාහ කරගත් වාකාටක පාලකයා කවරෙක් ද?
(1) වින්ධ්‍යශක්ති (2) ප්‍රවරසේන (3) දෙවන රුද්‍රසේන
(4) හරිසේන (5) පළමුවන පෘථිවිසේන (......)

**35.** හර්ෂවර්ධන රජු විසින් රචනා කරන ලද සාහිත්‍ය ග්‍රන්ථය කුමක් ද?
(1) හර්ෂ චරිත (2) ප්‍රියදර්ශිකා (3) ශාකුන්තල
(4) අමරකෝෂ (5) වික්‍රමෝර්වශී (......)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ **දෙක** බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා, ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | වැරදි ය. |
| 2 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |
| 5 | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | |
|---|---|---|---|
| **36.** | සාග්වේදය යනු පැරණිතම වේද ග්‍රන්ථයයි. | සාග්වෛදික යුගයේ කැපී පෙනෙන සිද්ධියක් වූයේ සුදාස් විසින් විශ්වමිත්‍රගේ මගපෙන්වීම මත කටයුතු කළ සන්ධානයක් යුද්ධයෙන් පරාජය කිරීම ය. | (……) |
| **37.** | ක්‍රි.පූ. 6 සියවසේ පැවති මහා ජනපද 16 පිළිබඳව අංගුත්තර නිකාය තොරතුරු ලබා දෙයි. | ජනපද 16 අතුරෙන් කිහිපයක් රාජාණ්ඩු වශයෙන් ද සෙසු ඒවා ගණ රාජ්‍ය වශයෙන් ද පැවතුණි. ප්‍රබල රාජාණ්ඩු වූයේ වත්ස, අවන්ති, කෝසල සහ මගධයයි. ලිච්ඡවීන්ගේ පාලන මණ්ඩලය රජවරු 7707 කින් සමන්විත වූ බවට කියවේ. | (……) |
| **38.** | ක්‍රි.පූ. 326 දී මහා ඇලෙක්සැන්ඩර් ඉන්දියාව ආක්‍රමණය කළේ ඛයිබර් දූර්ගය හරහා ය. | මහා ඇලෙක්සැන්ඩර්ට උතුරු ඉන්දියාව ආක්‍රමණය කළ හැකි වූයේ ගංගානම් ගඟ දක්වා පමණි. | (……) |
| **39.** | මහාබලිපුරම් නගරය පිහිටුවන ලද්දේ මහේන්ද්‍රවර්මන් විසිනි. | පල්ලව ගෘහනිර්මාණ ශිල්පයට රථ හඳුන්වා දීමේ ගෞරවය මහේන්ද්‍රවර්මන් හිමිකොට ගනී. | (……) |
| **40.** | සුප්‍රසිද්ධ තක්ෂිලා බෞද්ධ විශ්වවිද්‍යාලය පිහිටුවන ලද්දේ ධර්මපාල රජු විසිනි. | ධර්මපාල විසින් ඉන්ද්‍රායුධ පළවා හැරීමෙන් අනතුරුව චක්‍රායුධ කනෞජ් සිහසුනෙහි තබන ලදි. | (……) |

❊ ❊

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023 (2024)

ඉන්දිය ඉතිහාසය II (II කොටස)
இந்திய வரலாறு II (பகுதி II)
History of India II (Part II)

25 A | S | II

ඉන්දිය ඉතිහාසය - අති අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා

උපදෙස්:

* පිළිතුරු සැපයිය යුතු **මුළු** ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**
* **II කොටස A, B** හා **C** ලෙස කොටස් **තුනකින්** සමන්විත වේ.
* **A කොටසේ** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **B** හා **C** කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් **එක** ප්‍රශ්නයක්වත් තෝරා ගෙන **තවත්** ප්‍රශ්න **තුනකට** පිළිතුරු සපයන්න.
(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ඉන්දියාවේ දළ සිතියමක් I කොටස** සමඟ සපයා ඇත.)

## A කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

(i) සුලෙයිමාන් කඳුවැටිය
(ii) හරප්පා
(iii) මැලෙරිඩා කපොල්ල
(iv) යමුනා ගඟ
(v) සෞරාෂ්ට්‍ර
(vi) නර්මදා ගඟ
(vii) ප්‍රතිෂ්ඨාන
(viii) අමරාවතී
(ix) කෘෂ්ණා ගඟ
(x) කාංචිපුරම්
(xi) කෞශාම්බි
(xii) ථාර් කාන්තාරය

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගින්.)

## B කොටස

2. "ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ආරම්භය හා බිඳවැටීම නිශ්චිතව තීරණය කළ නොහැකිය." මෙම ප්‍රකාශය පහත සඳහන් මාතෘකා යටතේ සාකච්ඡා කරන්න.

(i) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ආරම්භය පිළිබඳ පවත්නා විවිධ මතවාද (ලකුණු 06යි)
(ii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය බිඳ වැටුණු ආකාරය (ලකුණු 06යි)

3. ක්‍රි.පූ. 6 වන සියවසේ උතුරු ඉන්දියාවේ පැවති දේශපාලන හා ආගමික තත්ත්වය පරීක්ෂා කරන්න. (ලකුණු 12යි)

4. "මෞර්ය අධිරාජ්‍යය වනාහි පූර්වගාමී රාජවංශ කිහිපයක් විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්ති ගණනාවක ප්‍රතිඵලයකි."

(i) මගධය කේන්ද්‍ර කරගත රාජ්‍යයක් ආරම්භ කළ මුල්ම පාලකයා නම් කරන්න. (ලකුණු 01යි)
(ii) මෞර්යයන්ට පෙර මගධය පාලනය කළ රාජවංශ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02යි)
(iii) මෞර්යයන්ට පෙර සිටි රාජවංශ විසින් අධිරාජ්‍යයකට අවශ්‍ය පදනම දමන ලද ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 05යි)
(iv) මගධය කේන්ද්‍ර කරගත් අධිරාජ්‍යයක් වශයෙන් ස්ථාවර කිරීමෙහිලා මෞර්ය රජවරු විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග පරීක්ෂා කරන්න. (ලකුණු 04යි)

5. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

   (i) වයඹ දිග දේශසීමා
   (ii) වර්ණාශ්‍රම ධර්ම
   (iii) මහා ඇලෙක්සැන්ඩර්
   (iv) කුෂාණයන් යටතේ බෞද්ධාගම

(ලකුණු 08 × 2 = 16යි.)

## C කොටස

6. "සමුද්‍රගුප්තගේ දිග්විජය ප්‍රතිපත්තිය සමාප්ත කරන ලද්දේ II චන්ද්‍රගුප්ත විසිනි." සාකච්ඡා කරන්න. (ලකුණු 16යි.)

7. චෝළ ප්‍රාදේශීය හා ග්‍රාමීය පාලනයේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ලකුණු 16යි.)

8. "පල්ලව සංස්කෘතිය දකුණු ඉන්දීය සංස්කෘතික ඉතිහාසයේ වැදගත් ස්ථානයක් සලකුණු කරයි."

   (i) සමුද්‍රගුප්ත රජු විසින් පරාජය කොට පසුව රජකමෙහි පිහිටුවන ලද පල්ලව රජු නම් කරන්න. (ලකුණු 01යි.)
   (ii) පල්ලව රාජධානියේ අගනුවර නම් කරන්න. (ලකුණු 01යි.)
   (iii) පල්ලව රාජධානිය ගොඩනැංවීමෙහිලා මහේන්ද්‍රවර්මන්ගේ සහ නරසිංහවර්මන්ගේ දායකත්වය පරීක්ෂා කරන්න. (ලකුණු 04යි.)
   (iv) සාහිත්‍යය, ආගම, කලාව හා ගෘහනිර්මාණ ශිල්පය යන ක්ෂේත්‍රයන්හි පල්ලවයන්ගේ දායකත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 10යි.)

9. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

   (i) අලහබාද් ප්‍රශස්තිය
   (ii) ගුප්තයන් යටතේ සාහිත්‍යය
   (iii) අරාබි ආක්‍රමණ
   (iv) බෙංගාලයේ පාලවරු

(ලකුණු 08 × 2 = 16යි.)

* * *

www.e-kalvi.com